**තුම්පනේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**--------------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 26 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | ------------------------- |
| (අ) | රු.666,325 කට මිල දී ගත් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | කසළ අංගනය නවීකරණය කිරීමට හා ජල ව්‍යාපෘති සංවර්ධනය කිරීම වෙනුවෙන් දරන ලද රු.2,349,607 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ලැබිය යුතු මුද්දර ගාස්තු රු.7,836,120 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |
| (ඈ) | විවිධ තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂය රු.414,166 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

#### 1.3.2 <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ----------------------------------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයන් 02 ක ශේෂ හා උපයෝගී ලේඛන අතර රු.7,632,339 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කිරීම් සිදු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර, විගණනයට වාර්තා කරමි. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම්<br>අවුරුදු 05 ට වැඩි ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.102,400 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර ලැබිය යුතු ශේෂය රු.1,445,526 ක් විය. | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීමට හා අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම්<br>අවුරුදු 01 ත් 05 ත් අතර ගෙවිය යුතු ශේෂ එකතුව රු.6,456,462 ක් විය. | ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | කොටසක් ගෙවා ඇති අතර, ඉදිරියේ දි අනෙකුත් මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.1,025,187 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා උපලේඛන, කාල විශ්ලේෂණ, ශේෂ ලැයිස්තු ආදිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.5 අනුකූල නොවීම**

**1.3.5.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>159(1) වගන්තිය | දේපළ 190 කින් වර්ෂ 01 ත් වර්ෂ 06 ත් අතර කාලයක සිට වරිපනම් බදු අය කර නොතිබුණි. | පනතේ වගන්තීන්ට අනුකූලව කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ව දැනුවත් කර අය කිරීමට කටයුතු කරමි. |
| (ii) | ජාතික පරිසර පනතේ නියමයන්ට අදාළව ප්‍රකාශයට පත් කරන ලද 2008 පෙබරවාරි 25 දිනැති අංක 1533/ 16 දරන ගැසට් පත්‍රයේ විධිවිධාන | අවලංගු වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර 31 ක් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>----------------------------- | | | |
| මු.රෙ. 571(3) | වසර 02 ක් ඉක්ම වූ රු.871,347 ක් වටිනා තැන්පත් නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) වෙනත් චක්‍රලේඛ<br>--------------------<br>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති මාලාව<br>----------------------------- | | | |
| 218 | ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සමීක්ෂණයක් සිදු කර ඇති අතර, ලේඛන ද යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,998,936 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,929,746 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,744,000 | 2,859,850 | 2,836,882 | 1,455,125 | 4,052,000 | 4,812,161 | 3,643,817 | 2,847,123 |
| (ii) | කුලී | 4,595,000 | 4,742,053 | 4,785,104 | 661,500 | 4,973,000 | 5,232,842 | 4,691,325 | 704,552 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,530,000 | 1,633,627 | 1,633,627 | -- | 2,695,500 | 2,409,146 | 2,469,146 | |
| (iv) | වෙනත් ආදායම් | 9,642,000 | 1,071,445 | 27,001,951 | 3,074,387 | 9,909,000 | 12,063,083 | 5,487,167 | 17,944,713 |
| | එකතුව | 18,511,000 | 10,306,975 | 36,257,564 | 5,191,012 | 21,629,500 | 24,577,232 | 16,291,455 | 21,496,388 |

**2.2.2 <u>වරිපනම් හා බදු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| අය විය යුතු රු.190,361 ක වරිපනම් සඳහා දේපළ ඒකක 04 ක් තහනම් කිරීම සඳහා හඳුනා ගෙන තිබූ නමුත්, එම කටයුතු සිදු කර නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවූ බැවින්, අපේක්ෂා කළ පරිදි කටයුතු කිරීමට නොහැකි බව දන්වමි. |
| **(ආ) කසළ බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.623,120 ක ආදායමක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| **(ඇ) ජල බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.345,974 ක් වූ ජල ගාස්තු අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. |

**2.2.3 <u>වෙනත් ආදායම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ත්‍රීරෝද රථ ගාස්තු රු.1,287,773 ක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ජංගම සේවා පවත්වා, ත්‍රීරෝද රථ සංගම් හරහා අය කිරීමට කටයුතු කරමි. |

**2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,440,678 ක් හා මුද්දර ගාස්තු රු.7,836,120 ක් විය. | ලැබිය යුතු මුදල් අය කළ යුතුවේ. | ඉදිරියේ දී මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**<u>අත් හැර දැමූ කර්තව්‍යයන්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුජාතා බාලිකා විදුහල ඉදිරිපිට වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් සඳහා රු.2,076,510 ක පිරිවැයක් දරා ව්‍යාපෘතිය අත් හැර දමා තිබුණි. | ව්‍යාපෘතිය නිවැරදිව ක්‍රියාත්මක කර අවසන් කළ යුතුවේ. | කොන්ත්‍රාත්කරු සමඟ දෙපාර්ශවයේ එකඟතාවය මත කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමි. |

**3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙවන හා තෙවන කාර්තුවට අදාළ රු.103,289 ක් වූ වරෙන්තු ගාස්තු බිල් කර නොතිබූ බැවින්, සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගත යුතුවේ. | පුර නැඟුම මෘදුකාංගයේ ඇති වූ දෝෂයක් නිසා, ගාස්තු අය කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කරමි. |

**3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 15 ක් පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී අදාළ ක්‍රියාමාර්ග ගනිමි. |

**3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාස 04 සිට මාස 26 ක කාලයක් දක්වා කසළ බදු නොගෙවූ ගිවිසුම්ගත ආයතන 33 ක් සඳහා ගිවිසුම පරිදි කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හිඟ අය කිරීමට කටයුතු කර, ප්‍රගතිය ඉදිරිපත් කරක බව දන්වමි. |
| (ආ) | සරත් අමුණුගම පොදු වෙළඳ සංකීර්ණය බදු දීමට අදාළ බදු ගිවිසුමේ කොන්දේසි අනුව, මාස 03 කට වඩා වැඩි කාලයක් වසා දමා ඇති ව්‍යාපාර ස්ථාන 14 ක් සම්බන්ධව කිසිදු පියවරයක් අනුගමනය කර නොතිබුණි. | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මෙම ඉඩම විධිමත්ව සභාවට භාර දී නොමැති බැවින්, සන්තකය ගැනීමට නොහැකි වී ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජල ව්‍යාපෘති 07 ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ දක්වා නොතිබුණි. | වත්කම් නිවැරදිව හඳුනා ගෙන ලේඛනගත කළ යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුව ලබා දෙන තක්සේරුව මත කටයුතු කරමි. |

**3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සරත් අමුණුගම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 47 කින් පසුගිය වර්ෂ 05 තුළ ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.695,559 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 15 ක් වසර 02 ත් වසර 19 ත් අර කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | වත්කම් මඟින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 භාණ්ඩ සමීක්ෂණය යටතේ මෙම අයිතම වෙන්දේසි කිරීම සඳහා කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය තුළ රු.74,703,059 ක ප්‍රාග්ධන වියදම් දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැත්තෑව හපුගොඩ හරහා මඩිගේ දක්වා යන පාළම සහ මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළ මූලික ඇස්තමේන්තුව අනුව, ඉදිකිරීම් සිදු නොකරන ලද අත් වැටක් වෙනුවෙන් රු.77,726 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | ඉදිකිරීම් අවසන් කළ කාර්යයන් සඳහා පමණක් ගෙවීම් කළ යුතුවේ. | කොන්ත්‍රාත් සමිතිය දැනුවත් කර අත් වැට සකස් කිරීමට කටයුතු කරමි. |

**4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

**4.1 <u>නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 – 3.1(අ)(ii)<br>2010 වර්ෂයේ රු.350,000 ක වියදමක් දරමින් ආරම්භ කළ සිමෙන්ති බිම් ඇතුරුම් ගල් ව්‍යාපෘතිය 2014 වර්ෂයේ සිට අත් හැර දමා තිබුණි. | ව්‍යාපෘති නිවැරදිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුව හරහා මිල ගණන් ලබා ගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |